# تاريخ المسلمين في سريلانكا- 10

# ශ්‍රී ලංකා මුස්ලිම් වරුන්ගේ අතීත පිය සටහන්-10

< سنهالية - සිංහල >


Author' name

අබූ ෆාතිමා

اسم المؤلف

أبو فاطمة


Translator's name:

Reviser's name:ම්හම්මද් අසාද්

ترجمة:

مراجعة:محمد آساد

# ශ්‍රී ලංකා මුස්ලිම් වරුන්ගේ අතීත පිය සටහන්-10

## ‘ලංකා යෝනක - සිංහල සම්බන්ධතා සැම විටම සුහද ඒවා විය’

(එම්. එම්. ටී. විසින් 1948 පෙබරවාරි 15 දින සිලෝන් ඔබ්සර්වර්

ඉරුදින සංග්‍රහය පුවත්පතට සැපයූ ලිපියක්)

සිංහල ජනයා විසින් ලංකා යෝනක ජනයා දැන හැඳින ගැනීම ක්‍රි. ව. පළමුවන ශත වර්ෂය තරම් ඈතට යන බව පෙරිප්ලන් ප්‍රකාශ කරන නමුත් ඉන්ඩිකොප්ලුස්ටෙස් පවසන අන්දමට ඒ සම්බන්ධතා ඇති වී තිබෙන්නේ හය වන ශත වර්ෂයේ බවය. කෙසේ වුව ද දැන් අප ලංකා යෝනකවරුන් යනුවෙන් හඳුන්වනු ලබන ජන කොට්ඨාසයේ මුතුන් මිත්තන් වූ අරාබි ජාතිකයින් වෙළඳුන් වශයෙන් අවිවාදයෙන් ම පෙරදිග ලෝකයේ ස්වාමිත්වය දැරූ බව නම් නිසැකය.

සිංහල ජනයා ඔවුන් හැඳින් වූ ‘මරක්කල මිනිස්සු’ නැතහොත් නාවිකයන් යන නාමයෙන් ම ඔවුන්ගේ ප්‍රභවය සහ රැකියාව විස්තර වන්නේය. සිංහල ජනයා ලංකාවේ රට අභ්‍යන්තරයේ ගොවිතැන් කටයුතු වලින් සෑහීමට පත් වූ අතර බාහිර ලෝකය ගැන ඔවුන්ගේ තැකීමක් එතරම් නොවීය. ඔවුන්ගේ විහාර ස්ථාන වල ශ්‍රී විභූතිය සහ උත්සව හැරෙන්නට ඔවුන්ගේ බාහිර ක්‍රියාකාරකම් කිසිවක් නොතිබුණ අතර ඔවුන් රෝමය, වැනීසිය, අරාබිය සහ අනෙකුත් විදේශීය රටවල් සමග වෙළඳාමේ මාර්ගයෙන් සම්බන්ධ කරන ලද්දේ යෝනක වරුන් විසිනි.

මේ දිවයිනේ මැණික්, සායම් ලබා ගන්නා දැව වර්ග, කුළුබඩු සහ ඇත් දළ වැනි දේවල් සහ සුඛෝපභෝගී ද්‍රව්‍ය යෝනක වරුන් විසින් විදේශීය රටවලට ගෙන යන ලද අතර චීනය තරම් ඈත රටවල් වලට පවා ඔවුහු ඒ ද්‍රව්‍ය සැපයූහ. එමෙන්ම ඒ රටවල වෙළඳ භාණ්ඩ ඔවුන් විසින් සිංහලුන්ගේ දොරකඩට ම ගෙනත් දෙන ලදී.

පණ්ඩුකාභය රජතුමා (ක්‍රි. පූ. හතරවන සිය වසේ දී) ස්වකීය මාමා වරුන් පරාජයට පත් කිරීමෙන් පසු තම රාජධානිය වශයෙන් අනුරාධපුරය තෝරා ගෙන නගරයේ සාමාන්‍ය සැලැස්ම පිළියෙල කළේය. එසේ පිළියෙල කිරීමේදී නගරයේ බටහිර දොරටුව අසල ‘යෝනකයන් සඳහා වෙන් කළ භූමිය’ යනුවෙන් භූමි භාගයක් වෙන් කළේය.

චීන දේශ ගවේෂකයෙකු වන පාහියන් පස් වන ශත වර්ෂයේ මුල් භාගයේ දී ලංකාවට පැමිණි විට ඉතා අලංකාර ලෙස සරසන ලද සාබියානු වෙළෙන්දන්ගේ නිවාස ඔහුට දක්නට ලැබුණු බව ඔහු කියා තිබේ. (සබා හෝ අරාබි යන වචන එකල සාමාන්‍යයෙන් භාවිත වූ වචන වේ). ‘බෞද්ධ රාජධානි පිළිබඳ වාර්තාවක්’ නමැති පොතෙහි ලෙග්ගේ විසින් සඳහන් කොට ඇති පරිදි යෝනක වරුන් යනුවෙන් දැන් හඳුන්වනු ලබන ජන

කොට්ඨාසයේ මුතුන් මිත්තන් වූ අරාබි ජාතිකයන් ලංකාවේ වෙළෙඳ ජනයා අතර ඉතා වැදගත් කොටසක් වූ බව සඳහන් කරයි.

ලංකා යෝනක වරුන් සහ සිංහල ජනයා අතර පැවති සම්බන්ධතා ඉතා සුහද ඒවා වූ බව ඉබ්නු බතූතා ද සඳහන් කරයි. “මම ලංකා ද්වීපයට පැමිණියෙමි. එහි ජනයා බෞද්ධයෝ වූහ. නමුත් මුස්ලිම් පූජක වරුන්ට ගරු සැලකිලි දක්වන අතර ඔවුන්ට තම නිවාස වල නවාතැන් දී ආහාර පාන ආදියෙන් සංග්‍රහ කිරීම මට දක්නට ලැබුණි. මේ සැලකීම අනෙකුත් ඉන්දියානු බ්‍රාහ්මණයන්ගේ හා හින්දූන්ගේ ක්‍රියා කලාපයට ඉඳුරාම වෙනස් විය. මෙම ඉන්දියානුවන් කිසිදාක මුස්ලිම් වරුන් සමග මිත්‍ර වීම හෝ ඔවුන්ට ආහාර පාන ආදියෙන් සංග්‍රහ කිරීම හෝ නොකරන නමුත් ඔවුන්ට එරෙහි ව ක්‍රියා කිරීම හෝ කතා කිරීම ද නොකළහ.

පෘතුගීසීන් ලංකාවට පැමිණි විට යෝනක ජනයා සිංහල ජනයා සමග එකතු වී මායාදුන්නේගේ සහ රාජසිංහගේ යුද්ධ හමුදා වලට බැඳී පෘතුගීසීන්ට විරුද්ධ ව සටන් කළහ. පෘතුගීසීන්ට විරුද්ධ ව කැලිකට් හි සැමෝරින්ගේ නාවික හමුදාවේ ආධාර මායාදුන්නේට ලබා දීමට මූලික ව ක්‍රියා කළේ මේ යෝනක ජනයාය.

අකුරණ යෝනක ජනතාවගේ ඉතිහාසය ගවේෂණය කිරීමේදී පෘතුගීසීන්ට විරුද්ධ ව රාජසිංහ රජුගේ හමුදාවේ අරාබි ජාතිකයින් තිදෙනෙකු ඉතා එඩිතර ව සටන් කළ බව ජේ. පී. ලුවිස් මහතා විසින් “සිලෝන් ඇන්ටිකවේරි” (හත් වන වෙළුම තුන් වන කොටස 187 වැනි පිටුව) නමැති පොතේ සඳහන් කොට තිබේ.

සිංහල රජවරු ඔවුන් ගැන ඉතා පැහැදී ඔවුන් මහනුවර පදිංචි කරවූහ. ඔවුන් විසින් උඩරට කාන්තාවන් විවාහ කර ගැනීමට අවසර ඉල්ලා සිටි විට රජතුමා ඔවුන්ට ඒ සඳහා ධෛර්යය දුන්නේය. ඒ අනුව ක්‍රියා කළ මේ තිදෙනා මහනුවර පෙරහැර පැවැත්වෙන අවස්ථාවේදී උඩරට තරුණියන් තිදෙනෙකු රජතුමාගේ අනුමැතියෙන් රජ මාලිගාවේ සඟවා තබා ගත්හ. මේ උඩරට තරුණියන් ආපසු ලබා දෙන ලෙස ඔවුන්ගේ ඥාතීන් විසින් රජතුමාගෙන් ආයාචනය කරනු ලැබූ විට රජතුමා ඔවුන්ට දුන් පිළිතුර වූයේ අරාබි ජාතිකයින් විසින් දැනටමත් එකී කාන්තාවන්ගේ අතින් අල්ලාගෙන ඔවුන් ගෙන ගොස් ඇති හෙයින් ඔවුන්ට අරාබි ජාතිකයින් සමඟම යැමට ඉඩ දීම සුදුසු බවය. අවසානයේදී ඥාතීහු ඊට එකඟ වූහ. ඉන් පසු මේ අරාබි ජාතිකයෝ අකුරණට ගොස් එහි පදිංචි වූහ. වර්තමාන අකුරණ යෝනක ජනතාව මොවුන්ගෙන් පැවත එන්නන් වෙති.

ලංකා යෝනක ජනතාවගේ සහජ දක්ෂතා සිංහල ජනයා විසින් අගය කරන ලදී. ගැටබෑරියේ පදිංචි ව සිටින ගෝපාල පෙළපතේ යෝනකවරු රාජකීය වෛද්‍යවරුන් වූහ. සුල්තාන් කුතියා නමැති යුනානි වෛද්‍යවරයා සෙනරත් රජුගේ (1604 – 1634) රජ වාසලට කැඳවනු ලැබ එහිදී ඔහු විසින් දක්වන ලද විශිෂ්ට දක්ෂතා නිසා ඔහු රාජකීය වෛද්‍යවරයෙකු වශයෙන් පත් කරනු ලැබීය. ගම්පොළ අසල පිහිටි අරන්කතු (කහටපිටිය) නමැති ගමෙන් ඉඩමක් රජතුමා විසින් ඔහුට තෑගී කරනු ලදුව ඔහු ඒ

ඉඩමේ ජීවත් ව සිට මිය ගියේය. රජතුමා විසින් සුල්තාන් කුතියා වෙත ප්‍රදානය කරන ලද සන්නසෙහි මෙසේ සඳහන් වී තිබේ.

"සැරද, ශත වර්ෂ 1553 (ක්‍රි. ව. 1631) වෙසක් මස (මැයි - ජුනි) අව තෙලෙස්වක තිථිය ලත් රවිදින ප්‍රකාශ කරනු ලබන රාජ ආඥාවයි. සුල්තාන් කුතියා විසින් රාජෝත්තමයාණන් වහන්සේට මනා වූත් පක්ෂපාත වූත් අවංක වූත් සේවයක් ඉටු කරනු ලැබූ හෙයින් උද පළාතේ අරන්කන්ද ග්‍රාමයේ පිහිටි වී පැල් පහක වපසරිය ඇති දරන්ඩ නමැති කුඹුර එහි පිහිටි වතු සහ ගස කොළ සියල්ල ඇතුළු ව ඔහුට සහ පරම්පරා ගණනාවක් යන තෙක් ඔහුගේ මුණුබුරු මිණිබිරියන්ට එම ග්‍රාමය භුක්ති විඳීමට මෙයින් ප්‍රකාශ කොට දෙනු ලැබේ. මෙසේ කරනු ලබන ආඥාව රාජ ආඥාවක් බව මෙයින් වැඩි දුරටත් ප්‍රකාශ කරනු ලැබේ".

ඔහුගේ පවුලේ සාමාජිකයින් "ගාල්ලේ වෙදරාළ" යනුවෙන් හඳුන්වනු ලැබූහ. ඔහු බෙහෙත් ගෙට නොහොත් රාජකීය වෛද්‍ය දෙපාර්තමේන්තුවට ඇතුළු කර ගනු ලැබිණ. වෙද පවුලක් (යෝනකවරු) වෙල්ලාල වරායට සමාන යැයි සලකනු ලැබූ බව ශ්‍රීමත් ඒ. සී. ලෝරී විසින් ගැසට් පත්‍රයෙහි සඳහන් කොට තිබේ. මේ වෛද්‍යවරයාගේ යුනානි වෛද්‍ය විද්‍යාවෙහි දක්ෂකම් නිසා දෙවන රාජසිංහ රජතුමා විසින් ද ඔහුට ඉඩම් තෑගි කරන ලදී. මේ රටේ යෝනක වෛද්‍යවරු රජ වාසලට විශිෂ්ට සේවයක් ඉටු කළහ.

මේ ජන කොට්ඨාස දෙක අතර පැවති සුහද සම්බන්ධතා 1915 වර්ෂයේ ඇති වූ අවාසනාවන්ත කැරලි කෝලාහල සිදු වූ අවස්ථාව තෙක් ශත වර්ෂ ගණනාවක් ම අඛණ්ඩ ව පැවත ආවේය. නමුත් පසු ව පෙනී ගොස් ඇති පරිදි මේ කැරැල්ල ආරම්භ කිරීමට ගිනි දල්වන ලද්දේ ද ඉන්දියානු මුස්ලිම් වරුන් විසිනි. ඔවුන් එසේ කොට සිංහල මිනිසුන්ගේ කෝපයට ලංකා යෝනක වරුන් පාත්‍ර කොට හොර රහසේම දිවයිනෙන් පිට ව ගොස් ඇත.

මේ සම්බන්ධයෙන් 1915 ජුනි 1 වැනි දින සිලෝන් ඔබ්සර්වර් පත්‍රයේ පළ වූ වාර්තාවක මෙසේ සඳහන් ව ඇත. 'වෙළඳගොඩ යෝනක ජනයා (ඉන්දියානු මුස්ලිම් වරුන්) සිය පවුල් සමග විශාල රංචු වශයෙන් තලයිමන්නාරම හරහා ඉන්දියාවට යමින් සිටිති'. එහෙත් ලංකා යෝනක ජනයාට සිංහල මිනිසුන් විසින් රැකවරණය දෙන ලද අවස්ථා රාශියක් දක්නට ලැබේ.

අවසානයේදී සාමය උදා වූ අතර විසි වර්ෂයක් තරම් කාලයක් ගත වීමෙන් පසු මෙකී ජන කොට්ඨාස දෙක අතර කලින් පැවති සුහදතා ව යළිත් ඇති විය.

මේ සුහදතා ව යළි ඇති කිරීමට ප්‍රධාන වශයෙන් මුල් වූයේ අභාවප්‍රාප්ත එන්. එම්. එම්. අබ්දුල් කාදර් සහ ඩබ්ලිව්. එම්. අබ්දුල් රහ්මාන් සහ පසු කාලයේ දී ශ්‍රීමත් මොහොමඩ් මාකන් මාකර් සහ සෙනෙට් සභික ඒ. ආර්. ඒ. රෂික් යන ජන නායකයෝය. සිංහල මිනිසුන් සමග මිත්‍රත්වය ඇති කරලීම සඳහා නිතරම ක්‍රියා කළ රෂික් මහතා සෝල්බරි වාර්තාව මත රාජ්‍ය මන්ත්‍රණ සභාවේ පවති විවාදයේදී (1945 නොවැම්බර් 10 දින)

යෝනක ජනයාගේ අදහස් උදහස් ප්‍රකාශ කරමින් මෙසේ පැවසීය. “මා සහ මාගේ ජාතියේ අනෙකුත් සාමාජිකයින් කළාක් මෙන් ද්‍රවිඩ ජනයා සිංහල ජනයා සමග එකමුතු වූයේ නම් මෙය ඉතා සතුටු දායක දිනයක් විය හැකි ව තිබුණි. සිංහල මිනිසුන් කෙරෙහි මම සම්පූර්ණ විශ්වාසය තබමි”.

(සිලෝන් ඔබ්සර්වර් - ඉරුදින සංග්‍රහය - 1948 පෙබරවාරි 15 දින)

# පෘතුගීසි සමයේ යෝනක ජනතාව

## ආචාර්ය කේ. ඩබ්ලිව්. ගුණවර්ධන විසිනි (ලංකා විශ්ව විද්‍යාලයේ ඉතිහාසය පිළිබඳ මහාචාර්ය)

## (අල් ඉස්ලාම් සඟරාව - 1967 ජනවාරි)

ලෝකයේ ප්‍රථම මුස්ලිම්වරු ක්‍රි. ව. 7 වන ශත වර්ෂයේ දී මුහම්මද් තුමාගේ ඉගැන්වීම් පිළි ගත් අරාබි ජාතිකයෝ වූහ. ඉස්ලාම් භක්තිය වැලඳ ගැනීමට පූර්වයෙන් පවා ඔවුහු දක්ෂ මුහුදු යාත්‍රිකයෝ වූහ. එහෙත් ඉස්ලාම් දහම නිසා ආගම සම්බන්ධයෙන් ද ඔවුන්ට මහත් ධෛර්යයක් ඇති වීමෙන් ඔවුන්ගේ සමුද්‍රික කටයුතු වලට මහත් උත්තේජනයක් ලැබිණි. ඔවුන්ගේ දේශපාලන බලය පැතිර යනවාත් සමගම මුහුදු ගමන් පිළිබඳ ඔවුන්ගේ උනන්දුව ද වැඩි විය. මධ්‍යධරණී මුහුදේ උතුරු වෙරළ අබිබවා ස්පාඤ්ඤ අර්ධද්වීපය නතු කර ගැනීමට ඔවුන්ගේ මුහුදු බලය ඔවුනට උපකාරී විය. මේ ආකාරයට ඉන්දියානු සාගරයේ සිට අත්ලාන්තික් සාගරය දක්වා විහිදුනු අධිරාජ්‍යයක් බිහි කර ගැනීමට ඔවුන්ට හැකි විය. මධ්‍යධරණී මුහුදේ ඔවුන්ගේ ක්‍රියාකාරකම් මෙන් නොව ඉන්දියානු සාගරයේ ඔවුන්ගේ සමුද්‍රික කටයුතු බොහෝ සාමකාමී විය. ඔවුන්ගේ වෙළෙඳ නැව් ඉන්දියානු සාගරයේ යාත්‍රා කොට සිල්ක්, කුළුබඩු, මුතු සහ මැණික් රැගෙන ආ අතර මේවා නිසා ඒ වෙළෙන්දන් ධනවත් වූවා පමණක් නොව බැග්ඩෑඩ් නගරය අරාබි නිසොල්ලාසයේ මධ්‍යස්ථානය බවට ද පත් විය. දේශපාලනමය වශයෙන් ව්‍යාප්තවත්ම ඔවුහු අනෙකුත් ජාතීන් සමග විශේෂයෙන්ම අප්‍රිකාවේ උතුරු දිග සහ නැගෙනහිර දිග ජාතීන් සමග අන්‍යෝන්‍ය ආවාහ විවාහ සිදු කර ගත්හ. එහෙත් ඔවුන් තම ජාතිකත්වය නොනැසී පවත්වා ගත් අතර අරාබි වරුන් යනුවෙන්ම ඔවුන් දිගටම හඳුන්වන ලදී.

මෙම අරාබි වරුන් මෙසේ වාණිජ කටයුතු වල නිරත ව සිටියදී මලබාර් වෙරළේ සිටි වෙළෙඳ මාධ්‍යමිකයින් ගැන සෑහීමට පත් නොවූ ඔවුනතුරෙන් ඇතැමුන් ලංකාවේ ප්‍රසිද්ධ ඇත්දත් සහ මැණික් සොයා ලංකාවට පැමිණි බව නිසැකයෙන්ම කිව හැකිය. කුරුඳු වැනි අනෙක් නිෂ්පාදන ගැන එතරම් උනන්දුවක් ඔවුන් තුළ එකල නොපැවතිණි. අරාබි සංචාරකයන්ගේ කතාන්තර වල සහ සෙරන්දීබ් (ශ්‍රී ලංකාව) රටට දී තිබූ විශේෂ තැනින් පිළිබිඹු වන්නේ මෙම රටේ ධන සම්පත් එකල දැරූ වැදගත්කමය. ඉස්ලාම් භක්තිය ප්‍රථම වරට මලබාර් වෙරළේ පැතිර යාම ආරම්භ වූයේ නව වන ශත වර්ෂයේ මුල

භාගයේදීය. මේ කාලයේදීම වාගේ අරාබි ජාතික මුස්ලිම් වරුන් ලංකාව සමග සම්බන්ධකම් ඇති කර ගත්තේ යැයි සිතිය හැකිය. ඉතා ශ්‍රේෂ්ඨ ගණයේ සංචාරකයෙකු වූ ඉබ්නු බතුතා පවා ඔහුගේ දේශ සංචාරයන්හි දී වාණිජ කටයුතු වල නියුක්ත බව සාධක දක්නට ඇත. මේ අනුව බලන කළ මුස්ලිම් ලෝකය සහ ලංකාව අතර තිබුණු සම්බන්ධතා වලදී වෙළඳාම කවදත් ප්‍රබල ව පැවති බලවේගයක් බව අපට සාධාරණ ව පිළි ගත හැකිය.

# මාධ්‍යමිකයා

එකොළොස් වන ශත වර්ෂයේ දී පමණ පෙරදිග වෙළඳ ද්‍රව්‍ය විශේෂයෙන්ම කුළුබඩු පිළිබඳ යුරෝපීය ඉල්ලුම ක්‍රමක්‍රමයෙන් වැඩිවත් ම ඒ අලුත් ඉල්ලුම පිරිමසාලීම සඳහා වෙළඳ කටයුතු අධික වන්නට වූයෙන් අරාබි ලෝකය සහ ලංකාව අතර පැවති සම්බන්ධතා ප්‍රමාණයෙන් ද වාර ගණනින් ද වැඩි වන්නට විය. ලංකාවේ කුරුඳු වලට ඉතා හොඳ ඉල්ලුමක් තිබුණු අතර ලංකා කුරුඳු ලබා ගැනීම සඳහාත් වෙනත් අගනා වෙළඳ ද්‍රව්‍ය ලංකාවේ නිෂ්පාදනය කරනු ලැබූ නිසාත් ආසියාවේ සහ යුරෝපය අතර වෙළඳාමේ මාධ්‍යමිකයන් වූ මුස්ලිම් වරුන් වැඩි වැඩියෙන් මේ දිවයිනට පැමිණෙන්නට ඇත. ලංකාවේ නිෂ්පාදන ලබා ගැනීම සඳහා බටහිර ආසියාවේ මුස්ලිම් වෙළඳුන් බොහෝ විට මේ දිවයිනට බෙහෙවින්ම පැමිණියේ යැයි සිතිය හැකිය. දහතුන් වන ශත වර්ෂයේ අග භාගයේ දී පළමු වන බුවනෙකබාහු රජු විසින් ඊජිප්තුව සහ ලංකාව අතර වෙළඳ ගිවිසුමක් ඇති කර ගැනීමට යෝජනා කරමින් තානාපති දූත පිරිසක් ඊජිප්තුවට යැවීමෙන් පැහැදිලි ව ඔප්පු වන එක් කරුණක් නම් ඉන්දියානු වෙරළ බඩ ප්‍රදේශ වල මාධ්‍යමිකයින් ඉවත් කරමින් කෙළින්ම වෙළඳ සම්බන්ධතා ඇති කර ගැනීමේ වාසිය ගැන රජතුමාගේ අවධානය යොමු වී තිබුණු බවය.

ඒ කෙසේ වුවද කල් යත්ම එක්තරා වෙනසක් ඇති විය. බටහිර ආසියාවේ වෙළඳුන් ලංකාවේ නිෂ්පාදන සඳහා බොහෝ විට ඉන්දියාවේ බටහිර වෙරළේ වෙළඳුන් කෙරේ වඩ වඩා විශ්වාසය තබන්නට වූ බව පෙනේ. මේ අනුව අරාබි ජාතිකයින් සහ බටහිර ආසියාතික වෙළඳුන් ලංකාව සමග කෙළින්ම වෙළඳාම් කිරීම ක්‍රමක්‍රමයෙන් අඩු කරන ලද බවත් ඉන්දියාවේ වෙරළබඩ ප්‍රදේශ වල එනම් ප්‍රධාන වශයෙන්ම ගුජරාටය, මලබාරය සහ කොරමැන්ඩල් වෙරළබඩ ප්‍රදේශ වල මුස්ලිම් වෙළඳුන් විසින් ඒ වෙළඳාම අත් කර ගන්නා ලද බවත් පෙනේ.

# ජනපද පිහිටුවීම

මේ සිදුවීම සනාථ කිරීමට විවිධ සාක්ෂි ඇත. පේෂ කාර්මික ජන කොටසක් වූ පසු ව සලාගම නොහොත් හාලි යනුවෙන් හඳුන් වන ලද ජන කොට්ඨාසය දහහතර වන ශත වර්ෂයේ දී පමණ යෝනක ජනයා විසින් මේ දිවයිනට හඳුන්වා දුන් පිරිසක් බව පිළි ගත හැකි පෘතුගීසි ලේඛන වලින් ඔප්පු වන පරිදි ජනවංශ කතා වලින් පෙන්නුම් කෙරේ. තවද

දහහතර වන ශත වර්ෂයේ මැද භාගයේදී පමණ බේරුවල ජනපද පිහිටුවීම කායල්පට්ටනම් ප්‍රදේශයෙන් පැමිණි ඉන්දියානු මුස්ලිම් වරුන් විසින් කරන ලද බව ජනප්‍රවාදයේ සඳහන් වී ඇත. මුස්ලිම් පූජක වරුන් අරාබියේ සිට පැමිණි බව මාලදිවයින් වල ඉතිහාසයේ සඳහන් වී ඇති අතර ඒ දිවයින් වල වෙළඳාම සහ විදේශීය සම්බන්ධතා ගැන පැවසීමේ දී සම්පූර්ණයෙන් ම පාහේ සඳහන් වනුයේ මලබාර් වෙරළ ගැනය. මේ සියල්ලටම වඩා වැදගත් වනුයේ දහසය වන ශත වර්ෂයේ මුල් භාගයේ දී ඉන්දියානු සාගරය බඳ වෙළඳාම ප්‍රධාන කොටම ඉන්දියානු මුස්ලිම් ජාතිකයන් අතර පැවති බවට අවිවාදාත්මක සාක්ෂි පෘතුගීසි ප්‍රභවයන්ගෙන් අපට ලබා ගත හැකි වීමය. ලංකාවේ වෙළඳාමෙන් බැහැර කිරීමට පෘතුගීසීන් විසින් උත්සාහ දරන ලද විදේශීය වෙළඳුන් ඉන්දියානු වෙරළබඩ ප්‍රදේශ වලින් පැමිණි අය බවට බැරෝස්, කූටෝ සහ ක්වේරෝස් ප්‍රකාශ කළහ. මේ හැරත් ලංකාවේ යෝනක ජනයා සහ මලබාර් වෙරළේ මුස්ලිම් ජනයා අතර ඉතා කිට්ටු සම්බන්ධතා පැවතුණු බවට පෘතුගීසි ලේඛන සාක්ෂි දරයි. අරාබි ජාතිකයින් සමග එවැනි සම්බන්ධතා තිබුණු බවට සඳහනක් දක්නට නැත. මේ අනුව බලන කළ කල් යාමේදී නිශ්චය වශයෙන්ම පහළොස් වන ශත වර්ෂය අවසානයේ දී අරාබි ජාතික හෝ වෙනත් බටහිර ආසියාතික වෙළඳුන් ලංකාවට නොපැමිණි බව නිගමනය කළ හැක. භූගෝලීය වශයෙන් ආසන්න තම ව පිහිටා තිබීම සහ සමුද්‍රික ප්‍රවණතාවන් නිසා ඉන්දියානු වෙරළබඩ ප්‍රදේශ වල මිනිසුන් සැම විටම මේ දිවයිනේ වෙළඳාම සම්බන්ධයෙන් වැදගත් ස්ථානයක් ගත් බවත් පහළොස් වන ශත වර්ෂය අවසානයේ දී ඒ වෙළඳාම පිළිබඳ ඒකාධිකාරය සම්පූර්ණයෙන්ම පාහේ ඔවුන් අතට පත් වී තිබුණු බවත් සිතා ගත හැකිය.

මේ ඉන්දියානු වෙළෙන්දෝ ප්‍රධාන වශයෙන්ම මුස්ලිම් වරුන් වූහ. මීට එක් ප්‍රධාන හේතුවක් වූයේ ඇතැම් සමාජ ආගමික තහංචි සහ කුල භේද නිසා මුහුදු මාර්ගයෙන් කෙරුණු වෙළඳාමෙන් හින්දු වෙළඳුන් ඈත් ව සිටීමය. හින්දු ඇදහීම අනුව මුහුදු තරණය කිරීම කිල්ලකට අසුවීමක් ලෙස සලකනු ලැබූ හෙයින් මුහුදු ගමනකින් පසු ඉතා දුෂ්කර වූත් වියදම් අධික වූත් පවිත්‍රතා ශාන්තිකර්ම සිදු කිරීමට ඔවුන්ට සිදු විය. සමුද්‍රය ආශ්‍රිත වෙළඳුන් අතර වැඩි දෙනා මුස්ලිම් වරුන් වීමට තුඩු දුන් තවත් සාධක තිබේ. ඉන්දියාවේ වෙරළබඩ විසූ ඉතා ක්‍රියාශීලී ඇතැම් මිනිසුන් ඉස්ලාම් ආගමට හැරුණු බව පෙනේ. මේ අනුව වෙරළබඩ විසූ ගුජරාත් සහ බෙන්ගාලි ජාතිකයන්ගෙන් බොහෝ දෙනෙකු සහ මලබාර සහ කොරමැන්ඩල් වෙරළාශ්‍රිත ප්‍රදේශ වල බොහෝ දෙනෙකු දහහතර වන ශත වර්ෂය වන විට ඉස්ලාම් භක්තිය වැළඳ ගත් බව පෙනේ.

තවද ඔවුන්ගේ සමභක්තිකයන් විසින් ආසියාවේ වාණිජ ක්ෂේත්‍රයේ දරන ඉතා වැදගත් තත්ත්වය නිසා මේ නව මුස්ලිම් භක්තිකයන්ට වෙළඳ කටයුතු අතින් මහත් වාසියක් සැලසිණි. ඉතා වටිනා කුළුබඩු රාශියක් ම නිපද වූ නැගෙනහිර ලෝකයේ මහා වෙළඳපොළ වූ මලක්කාව සහ නැගෙනහිර ඉන්දියානු දූපත් ඉස්ලාමීය බලකොටු වූ අතර බටහිර දෙසට යන විට පෙරදිග නිෂ්පාදන බටහිර රටවලට අපනයන කරන ප්‍රධාන මධ්‍යස්ථානය වූ ඊජිප්තුව ඇතුළු බොහෝ වෙළඳ මධ්‍යස්ථාන ඉස්ලාමීය ඒවා විය. මේ නිසා කිසිදු බලය පාවිච්චි කිරීමකින් තොරව සාමකාමී තරඟයකින් පමණක් ලංකාව ද

ඇතුළු ව ඉන්දියානු සාගරයේ වෙළඳාම පිළිබඳ ඒකාධිකාරය මුස්ලිම් වෙළඳුන් අතට පත් වීම පුදුමයට කාරණයක් නොවේ.

පෘතුගීසීන් පැමිණීමට පෙර ලංකාවේ පදිංචි වී සිටි මුස්ලිම් ජාතිකයන් ගැන වඩා සවිස්තර ව තොරතුරු විමසා බැලීමට මේ අවස්ථාව උපයෝගී කර ගැනීම වැදගත් වේ. මුල්ම මුස්ලිම් පදිංචිකරුවන් අරාබි මූලයකින් පැවත ආ අය විය යුතුය. අරාබියෙන් පිටුවහල් කළ අරාබි ජාතිකයින් ලංකාවේ පදිංචියට පැමිණීම සම්ප්‍රදායක් ව තිබුණු බව ශ්‍රීමත් ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන් සඳහන් කරයි. මේ සම්බන්ධයෙන් සොයා ගැනීමට ඇති සාක්ෂි වල නොපැහැදිලිකම සහ සැක සහිතකම නිසා මේ ජනප්‍රවාදය පිළිගැනීම අපහසුය. මුලින්ම පදිංචියට ආ මුස්ලිම් ජාතිකයින් සාමාන්‍යයෙන් වෙළඳුන් වූ බව සිතිය හැකිය. එහෙත් තම මව් බිම හැර දමා ඉතා ඈත පිහිටි නොදන්නා රටක් තම වාස භූමිය කර ගැනීමට කැමැති වූ සංඛ්‍යාව සියයකට වැඩි නොවිය හැක. මේ නිසා කවර වූවද එක් ශත වර්ෂයකදී ලංකාවේ පදිංචියට පැමිණි අරාබි ජාතිකයින්ගේ සංඛ්‍යාව සිය ගණන් දහස් ගණන් නොව දුසිම් දහයකට දොළහකට වැඩි නොවුයේ යැයි අපට සිතිය හැකිය.

ලංකාවේ පදිංචියට පැමිණි අරාබි ජාතිකයින් සංඛ්‍යාව අඩු වූවද ලංකාවේ වරායවල් අසල යෝනක ජනගහනය මීට බොහෝ වැඩි වූවා විය හැකිය. ඉන්දියාවේ බටහිර වෙරළට සහ ලංකාවට පැමිණීමේ දී ඒ දීර්ඝ ගමන නිසා මාස ගණනක් තම මව් රටින් ඈත් වී සිටීමට මේ වෙළෙඳුන්ට සිදු වූ අතර බොහෝ අවස්ථා වල දී වාසිදායක මෝසම් සුළං ලැබෙන තෙක් දීර්ඝ කාලයක් ඇතැම් ස්ථාන වල රැඳී සිටීමට ඔවුන්ට සිදු විය. ඒ නිසා කල් යත්ම අරාබි හා සිංහල නැතහොත් අරාබි හා ද්‍රවිඩ යන මිශ්‍ර පරම්පරාවක් ලංකාවේ වරායවල් අසබඩ උද්ගත වීම ස්වභාවිකව ම බලාපොරොත්තු විය හැකි දෙයකි. කලක් ගත වීමෙන් පසු 14 වන සහ 15 වන ශත වර්ෂ වලදී සිදු වූවාක් මෙන් කලාතුරකින් හෝ පැමිණෙන මුස්ලිම් නොවන වෙළඳුන් ලංකාවට පැමිණි විට මේ මිශ්‍ර ප්‍රජාව බොහෝ සෙයින් ඉස්ලාමීය ලක්ෂණ වලින් යුක්ත වූවා නිසැකය. එහෙත් ඒ වන විට නැතහොත් ඊට ද පෙර සිට මේ ජනපද වල අරාබි ජාතිකයින්ට වඩා ඉන්දියානු මුස්ලිම් වෙළඳුන්ගේ සංඛ්‍යාව වැඩි විය. තවත් කල් යාමේ දී වරායවල් ආශ්‍රිතව සංවර්ධනය වූ යෝනක ජනාවාස වලට අමතර ව ඉතා ශීඝ්‍රයෙන් දියුණු වූ තවත් මුස්ලිම් ජනාවාසයක් බිහි විය. මේ වූ කලී බේරුවලය. 1344 දී ඉබ්නු බතුතා ලංකාවේ වෙරළාශ්‍රිත ව යාත්‍රා කළ අවධියේ දී බේරුවල මුස්ලිම් ජනාවාසයක් ව නොපැවති බව පෙනේ. ඉන් අවුරුදු පහකට හයකට පසු එය ඉතා වැදගත් මුස්ලිම් ජනාවාසයක් වූ අතර ජෝන් ඩී. ම්‍රිඤේලි එයින් අතෘප්තියට පත් වූ බව පෙනේ.

බේරුවල ජනාවාසය කායල්පට්ටිනම් වලින් පැමිණි ජනයාගෙන් බිහි වූ බව ජනප්‍රවාදයේ එයි. 16 වන ශත වර්ෂයේ මුල් භාගයේ දී ලියැවුණු පරෙවි සංදේශයේ සහ ගිරා සංදේශයේ බේරුවල ජනතාව බබුරු ජනයාගෙන් සමන්විත වූ බව පවසා ඇත. බබුරු යනු මුස්ලිම් ජනයා හැඳින්වීමට යෙදුණු යෝනක හෝ මරක්කල වැනි තවත් නාමයකි.

මේ අනුව බලන කළ පෘතුගීසීන් ලංකාවට පැමිණෙන විට ලංකාවේ විසූ මුස්ලිම් ජනතාව සිංහල ද්‍රවිඩ සහ වෙනත් දකුණු ආසියාතික ජාතීන් ප්‍රමුඛ විවිධ ජාතීන්ගේ සංකලනයකින්

බිහි වූ ජාතියක් බව පෙනේ. එවකට ලංකාවේ විසූ මුස්ලිම් ජනයාගේ සංඛ්‍යාව මෙතෙකැයි අනුමාන කිරීම අපහසුය. එහෙත් චීන ආණ්ඩුව විසින් ස්වකීය සාරධර්ම අනුගමනය කරමින් 15 වන ශත වර්ෂයේ දී චෙං හෝගේ දූත පිරිස ලංකාවට එවන ලද අවස්ථාවේ ලංකාවේ බෞද්ධ පූජනීය ස්ථාන සඳහා පූජා භාණ්ඩ එවීමත් සමගම මුස්ලිම් දේවස්ථානයක් සඳහා ද පූජා භාණ්ඩ එවීමෙන් පැහැදිලි වන එක් කරුණක් නම් ඒ කාලයේ සැහෙන මුස්ලිම් ජනකායක් ලංකාවේ විසූ බවය. තවද ඊළඟ ශත වර්ෂයේ ආරම්භයේ දී පෘතුගීසීන් ලංකාවට පැමිණෙන විට වෙරළබඩ ප්‍රදේශයේ සෑම තැනම පාහේ විශේෂයෙන් ම කොළඹ විශාල මුස්ලිම් ජනාවාස තිබුණු බව ඔවුන්ට දක්නට ලැබී ඇත.

පෘතුගීසි සමය ලංකා යෝනක ජනයාට විපත්තිකර කාලයක් නැතහොත් යටත් පිරිසෙයින් අවිනිශ්චිත කාල පරිච්ඡේදයක් විය. පෘතුගීසීන් ආසියාවට පැමිණි දා සිටම වෙළඳාම පිළිබඳ ඒකාධිකාරය තමන් අතට ගැනීමේ අභිලාෂයෙන් ඔවුහු ඉන්දියානු සාගරයේ මුස්ලිම් වෙළඳුන්ට හැකි සෑම අයුරින්ම අලාභ හානි කළහ. තම ප්‍රදේශ වලින් මුස්ලිම් ජනයා පිටුවහල් කිරීමට හෝ යටත් පිරිසෙයින් ඔවුන් විෂයයෙහි විවිධ සීමා පැනවීමට මලබාර් වෙරළේ පාලකයන් ඉච්ඡා බස් මගින් පෙලඹ වීමට පෘතුගීසීහු උත්සාහ කළහ. කැලිකට් ප්‍රදේශයේ හැර අනෙක් ප්‍රදේශ වල ඔවුන්ගේ උපාය බොහෝ දුරට සාර්ථක විය. වාණිජ ක්ෂේත්‍රයෙහි ලා මුස්ලිම් වරුන් තරඟකාරී භාවය නැති කිරීම සඳහා පෘතුගීසීහු මුහුදු කොල්ල කෑමේ ද මුස්ලිම්වරුන්ට දරුණු වධහිංසා පැමිණවීමේ ද යෙදුනහ. ඔවුන්ගේ මේ ස්වාර්ථ ලාභය පිළිබඳ චේතනාව සමගම එකල යුරෝපයේ ප්‍රබල ව පැවති ලක්ෂණයක් වූ ආගම පැතිරවීමේ අභිලාෂය ද උත්සන්න ව පැවතිණ.

යෝනක ජාතිකයන්ට එරෙහි ව ස්වාධීනත්වය සඳහා දීර්ඝ කාලයක් තිස්සේ පැවති දරුණු අරගලයේ මතකය නිසා මෙය තවත් ප්‍රබල විය. ආසියාවේ මුස්ලිම් වරුන් කුමන ගෝත්‍රයකට හෝ ජාතියකට අයත් වූවද පෘතුගීසීන් විසින් ඔවුන් ව සලකන ලද්දේ තමන් ද්වේෂ කළ 'යෝනක' ජාතිකයන් ලෙසටය. ශත වර්ෂ කීපයක් මුළුල්ලේ පෘතුගීසීහු මේ යෝනක ජාතියට යටත් ව සිටියහ. එමනිසා ආගමික මෙන් ම වාණිජ කටයුතු සඳහා ලංකාවේ ද යෝනක ජනයා පිටුදැකීම පෘතුගීසීන්ගේ අභිලාශය විය. මේ අතුරින් වාණිජ පරමාර්ථය අනෙක් සියල්ල අබිබවා සිටියේය. කුරුඳු වෙළඳාම සහ රාජධානියේ විදේශීය වෙළඳාමේ අංශ විෂයයෙහි ඒකාධිකාරයක් ඇති කර ගැනීමෙහි ලා ඔවුන්ට තිබුණු එකම බාධකය යෝනක ජනයා විය.

ස්වදේශික සිංහලයෝ විදේශීය වෙළඳාම කෙරෙහි කිසිදු උනන්දුවක් නොදැක්වූහ. එහෙත් කෝට්ටේ රජවරුන් කොතරම් දුර්වල වුවත් අලුතින් ආ පෘතුගීසි අමුත්තන් ගැන කෙතරම් බියක් දැක්වූවත් අදාළ සියලු පාර්ශව වලට ලාභ ගෙන දෙන පරිද්දෙන් සාමකාමී ලෙස මෙතෙක් කල් වෙළඳාම් කර ගෙන ගිය යෝනක ජනයා පන්නා දැමීමට ඒ රජවරුන් පොලොඹවා ගැනීම පෘතුගීසීන්ට අපහසු කාර්යයක් විය. පෘතුගීසීන්ගේ හැසිරීම සමග සංසන්දනය කොට බලන විට යෝනක ජනයා සෑම විටම රජුගේ ආධිපත්‍යය කෙරෙහි ගෞරවයක් ද සිංහල ජනයාගේ චාරිත්‍ර වාරිත්‍ර ගැන සැලකිල්ලක් ද

දැක්වූහ. පෘතුගීසි ලේඛකයෙකු වූ ක්වේරෝස් මේ තොරතුරු අපට සැපයීය. ඔහු පවසන පරිදි ඇඳුම් පැලඳුම් වල දී පවා රටේ චාරිත්‍ර වාරිත්‍ර වලට අනුව හැඩ ගැසීමට යෝනක ජනයා සමත් විය. සිංහල ජනතාව සහ එකල විසූ බොහෝ ආසියානු ජාතිකයන් විසින් අන්‍යයන්ගේ ආගම් වලට අවහිරයක් නොකොට ඉවසා සිටීමේ ජාතික ලක්ෂණය ගරු කරමින් යෝනක ජනයාගේ ආගම නිදහසේ ඇදහීමටත් ආගමික චාරිත්‍ර වාරිත්‍ර සහ උත්සව නිදහසේ පැවැත්වීමටත් ඔවුන්ට ඉඩ දී තිබුණේය. යෝනක ජනයා ද ඔවුන්ගේ යුතුකම ඉටු කරමින් මිනිසුන් තම ආගමට හරවා ගැනීමේ ක්‍රියාමාර්ගයක් අනුගමනය නොකළහ.

# උඩඟුකම

යෝනක ජනතාව සහ සිංහල ජනතාව අතර පැවති සුහද සම්බන්ධතා කවරේ වුවද පෘතුගීසීන් විසින් දක්වන ලද උඩඟු භාවය සහ කෲර භාවය හේතු කොට ගෙන ඒ සම්බන්ධතා තව දුරටත් ශක්තිමත් විය. මේ ප්‍රබල විදේශිකයින් වෙත පොදු මිත්‍රත්වයක් ඇති වීම ඥාණාන්විත යැයි සිංහල රජවරුන් විසින් අදහස් කරන ලද අවස්ථා වල දී පවා රටේ ජනතාව සහ යෝනක ජනතාව පෘතුගීසීන්ට දැක් වූ විරුද්ධවාදීකම් එලෙසින් ම පවත්වා ගෙන ගියහ. දෙවන විජයබාහු රජුගේ ආධිපත්‍යය කෙරෙහි සැලකිල්ලක් නොදක්වා රාජධානියේ වෙළඳාම අවුල් කළ පෘතුගීසීන්ට විරුද්ධ ව යුද්ධ කිරීමට ඔහු අදහස් කළ අවස්ථාවේ දී ඔහු යෝනක ජනයාගේ සහයෝගය පැතීය. මලබාරයේ තම සහෝදර ජනතාව සමග ඉතා කිට්ටු සම්බන්ධතා පැවැත් වූ යෝනකවරු පෘතුගීසීන්ගේ පරම සතුරෙකු වූ කැලිකට් හි හින්දු රජුගේ උපකාරය විජයබාහු රජුට ලබා දීමට ඉදිරිපත් වූහ. කැලිකට් හි මහා රාජාගේ නාවික හමුදාව මෙහෙය වන ලද්දේ මුස්ලිම් නාවිකයන් විසිනි. එහෙත් පෘතුගීසීන්ට විරුද්ධ ව සටන් කිරීමට කැලිකට් නාවික හමුදාව ප්‍රමාණවත් නොවීය. එසේ වුවද වෙනත් බොහෝ අවස්ථා වල දී මෙන් ම මේ නාවික හමුදාව පැමිණීමෙන් පෙනී ගිය එක් කරුණක් නම් ලංකා යෝනක වරුන්ගේ රාජපාක්ෂිකත්වය මෙන් ම මේ කාලයේ දී මලබාරය සමග ඔවුන් කෙතරම් කිට්ටු සම්බන්ධතාවක් පැවැත්වී ද යන්නය.

# පිටුවහල් කිරීම

අවසානයේ 1526 දී පෘතුගීසීහු ඔවුන්ගේ ප්‍රධාන අරමුණු වලින් එකක් ඉටු කර ගත්හ. 1521 න් පසු කෝට්ටේ රාජධානිය වෙන් කර ගැනීමෙන් පසු කෝට්ටේ රජ වූ තුන්වන විජයබාහු රජු යෝනක ජනයා නෙරපා හැරීමට එකඟ විය. මේ තීරණය ගැනීමට බොහෝ දුරට රජු පොලොඹ වන ලද්දේ ඔහුගේ හිතෛෂීවන්ත අනුශාසකයෙකු වූ පෘතුගීසී ජාතික ෆ්රෙයිඩ් අන්ද්‍රාදේ විසිනි. ඇතැම් මලබාර් අද්මිරාල් වරුන්ගේ උඩඟු හැසිරීම ද ඔහුගේ මේ පියවර ගැනීමට තුඩු දුන් තවත් හේතුවක් විය හැකිය. මලබාර් වරුන් සහ ස්වදේශීය යෝනක ජාතිකයින් අතර කූට සහයෝගීතාවක් ඇතැයි සහේතුක ව ඔහු සැක කළේය. යෝනක ජාතිකයින් බුවනෙකබාහුගේ සොහොයුරා වූ සීතාවක මායාදුන්නේට වැඩි

කැමැත්තක් දැක් වූ බවද පෙනෙන්නට තිබිණි. මායාදුන්නේ දක්ෂ රණශූරයෙකු වූ නිසාත් විජයබාහු ජීවත් ව සිටි කාලයේ දී පවා පෘතුගීසීන්ට විරුද්ධත්වය දැක් වූ අය අතුරින් ඔහු නායකත්වය දැරූ නිසාත් මේ සැලකිල්ල ස්වභාවික දෙයකි.

මායාදුන්නේ වෙත දක්වන ලද මේ සැලකිල්ල සහ කැමැත්ත කුමන හේතුවක් නිසා වූවද තම සොහොයුරාගේ විශිෂ්ට හැකියාවන් නිසා බුවනෙකුබාහු ඔහු නොරිස්සූ අතර ඔහු ගැන ඊර්ෂ්‍යාවක් සහ බියක් ද බුවනෙකුබාහුට ඇති වී තිබිණි. මායාදුන්නේ යෝනක ජනයා වෙනුවෙන් මැදිහත් වූ නමුත් ඔවුන් තෙදිනක් ඇතුළත තම රාජධානියෙන් පිට විය යුතු යැයි බුවනෙකුබාහු තරයේම අණ කළේය. මෙවිට සීතාවක රජු විසින් ඔවුන් තම රාජධානියට කැඳවා ගන්නා ලදින් රටේ අභ්‍යන්තර පළාත් වල යෝනක ජනයා වැඩි වශයෙන් පදිංචි වීමට වූයේ ඉන් පසුවය. පුත්තලමේ යෝනක ජනපද බිහිවීම ද මේ කාලයට අයත් බව නිසැකයෙන්ම කිව හැකිය. ප්‍රධාන පාලකයා වශයෙන් බුවනෙකුබාහු රජු විසින් කළින් නොබෙදී තිබුණු කෝට්ටේ රාජධානියේ නිරිත දිග මුහුදු බඩ ප්‍රදේශය සම්පූර්ණයෙන්ම තම පාලනය යටතට ගන්නා ලදී. එහෙත් ස්වකීය රාජධානියේ බාහිර දොරටුවක් වශයෙන් පාවිච්චි කිරීමට මායාදුන්නේට පුත්තලම දෙන ලදී. කෙසේ වූවද පුත්තලම මායාදුන්නේගේ රාජ්‍යයට අයිති ව තිබුණු බවට ක්වෙරෝස්ගේ කෘති සහ රාජාවලිය සාක්ෂි දරයි. ප්‍රධාන වරාය වූ කොළඹ වරාය අවට ප්‍රදේශයේ කළින් සන සැරේට පදිංචි වී සිටි යෝනක ජනයා තමන්ගේ වෙළඳ කටයුතු සඳහා උපයෝගී කොට ගත හැකි එකම වරාය වූ පුත්තලම ප්‍රදේශයට මේ සමගම සංක්‍රමණය වූ බව පෙනේ.

දෙසොහොයුරන් අතර පැවති යුද්ධ වල දී යුද භටයන් වශයෙන් පමණක් නොව කැලිකට් හි පාලකයන්ගේ නිරතුරුවම ආධාර උපකාර ලබා ගැනීමෙහි ලා තානාපති නියෝජිතයන් වශයෙන් ද මේ යෝනක ජනයා ක්‍රියා කිරීම නිසා ඔවුහු මායාදුන්නේට ඉතා ප්‍රයෝජනවත් ජන කොට්ඨාසයක් වූහ. මලබාර් හේවායන් සහ නාවිකයන් අනිවාර්යයෙන් ම පෘතුගීසීන් විසින් පරාජය කරනු ලැබූ නමුත් පෘතුගීසීන්ගේ අවධානය ඔවුන් වෙත යොමු කරවා ගෙන තිබුණු හෙයින් යටත් පිරිසෙයින් එක්තරා ප්‍රමාණයකට පෘතුගීසීන්ගේ අවධානය සිංහල සේනාවන්ගෙන් ඈත් කොට තැබීමට ඉන් ඉඩකඩ සැලසිණි.

මේ හැරෙන්නට යෝනක කාලතුවක්කු භටයෝ සහ කාලතුවක්කු වල සේවා නූල් දල්වන්නෝ සිංහල යුද්ධ යන්ත්‍රයේ අඩු තැනක් පිරවීමට සමත් වූහ. මායාදුන්නේ විසින් මලබාර් සේනාපතිවරුන් කීප දෙනෙකු නිර්ලජ්ජිත සේ පෘතුගීසීන්ට පාවා දීම නිසා කැලිකට් රාජ්‍යයෙන් ඔහුට ලැබුණු සහයෝගය හදිසියේම නතර විය. එහෙත් බුවනෙකුබාහුගේ අනුප්‍රාප්තිකයා පෘතුගීසීන්ගේ පඹයෙකු බවට පත් වීම නිසා කෝට්ටේ ජනයා පවා මායාදුන්නේගේ ධජය වටා රොක් වන්නට වූහ. මේ වන විට සීතාවක යුද හමුදාව නවීන යුද ක්‍රම පුහුණු වී පළපුරුදු යුද භටයන් බවට පත් ව සිටි හෙයින් නොබෝ කලකින් ම කෝට්ටේ අත්පත් කොට ගෙන පෘතුගීසීන්ගේ පඹයෙකු වූ දොන් ජුවාන් ධර්මපාල සහ ඔහුගේ පෘතුගීසී ආරක්ෂකයන් කොළඹ කොටුවට සීමා කිරීමට ඔහු සමත් විය.

බුවනෙකබාහු රජු විසින් මෙතෙක් කල් යෝනක ජනයා නෙරපා හැර තිබුණු වරාය වලට (පෘතුගීසීන් යටතේ තිබුණු කොළඹ වරාය හැර) බාධාවකින් තොරව ආපසු ඒමේ අවස්ථාව මේ වකවානුවේ දී එනම් එක්දහස් පන්සීය හැට ගණන් වල මුල භාගයේ දී යෝනක ජනයාට ලැබුණේය. ඔවුහු විශාල වශයෙන් මන්නාරම පුත්තලම හලාවත මීගමුව කළුතර බේරුවල අලුත්ගම බෙන්තොට ගාල්ල සහ වැලිගම පදිංචි වන්නට වූහ. 1575 දී මුහුදුබඩ ප්‍රදේශයේ කරන ලද වැටලීමක දී යෝනක ජනයා බොහෝ දෙනෙකු වැලිගම දී මරා දමන ලද බව පෘතුගීසීන් විසින් විශේෂයෙන් ම සඳහන් කොට තිබේ

# නව පිළිවෙත

මායාදුන්නේගේ පුත් පළමු වන රාජසිංහ රජුගේ මරණින් පසු ඔහුගේ රාජධානියේ බොහෝ කොටස් පෘතුගීසීන්ගේ අතට පත් වූයේ ස්වල්ප දෙනෙකු හැර මෙතෙක් කල් තමන්ට තදබල ලෙස විරුද්ධවාදිකම් දැක් වූ මේ යෝනක ජනතාව සම්බන්ධයෙන් අනුගමනය කිරීමට සුදුසු ප්‍රතිපත්තියක් ගැන තීරණයක් ගත යුතු බව පෘතුගීසීන්ට වැටහී ගිය පසුය. මෙතෙක් කල් පැවති තත්ත්වය වෙනස් නොකිරීමට ඔවුන් පළමු වරට අදහස් කළ බව පෙනේ. මේ අවස්ථාවේ දී පෘතුගීසීන් කන්ද උඩරට සමග ප්‍රබල යුද්ධයක පැටලී සිටි නිසා යෝනක වරුන්ට ද විරුද්ධ ව ක්‍රියා මාර්ගයක් ගැනීමෙන් තවත් කරදර වැඩි කර ගැනීමට පෘතුගීසීන් අපේක්ෂා නොකළා විය හැකිය.

අනෙක් අතට නොකඩවා කෙරුණු යුද්ධ නිසා තමාට අයත් ප්‍රදේශ වල කෘෂිකර්ම කටයුතු අඩාළ වී තිබියදී බාහිර ලෝකයෙන් තමන්ට ආහාර ද්‍රව්‍ය සැපයූ මලබාර් වෙරළේ මුස්ලිම් ජනතාව අත් නොහැරිය හැකි තත්ත්වයක් ද මෙවිට එළඹ තිබිණි. මේ හැරෙන්නට මේ දිවයින මූලස්ථානය කොට ගත් නැව් පැදවීම සඳහා සිංහල ජනයා දක්ෂ නොවූ හෙයින් යෝනක වරුන් ඒ කාර්යයෙහි යොදවා ගැනීමේ පහසුව ද මේ අවස්ථාවේ දී පෘතුගීසීන්ට වැටහුණු බව ප්‍රකාශ කරන ක්වෙරෝස් යෝනක ජනයා වෙත පෘතුගීසීන් දැක් වූ මේ ආකල්පයට ප්‍රධානතම හේතුව පෞද්ගලික ලාභය ගැන දැක් වූ සැලකිල්ල බව වැඩි දුරටත් පෙන්නුම් කරයි.

මේ හේතු කොට ගෙන ගෝවේ ප්‍රාදේශීය බල මණ්ඩලයක් මෙන් ම පෘතුගීසී රජු විසින් යෝනක ජනයාට විරුද්ධ ව දැඩි පියවර ගැනීමට අණ කොට එවන ලද නියෝග ලංකාවේ පෘතුගීසීන් විසින් නොසලකා හරින ලදී. මේ අනුව බලන කළ ලංකාවේ නිරිත දිග ප්‍රදේශයේ පෘතුගීසී පාලනය පිහිටුවන ලද මුල් අවස්ථාවේ සිට ම යෝනක වරු සෞභාග්‍යමත් තත්ත්වයක් ඉසිලූහ. යෝනක ගම් මුලාදෑනිවරු සහ ග්‍රාමීය මට්ටමේ වෙනත් නිලධාරීහු මුහුදු බඩ ප්‍රදේශ කිහිපයක ම නිල දැරීම දිගටම කර ගෙන ගියහ. යෝනක වරුන්ගේ ජනගහනය කෙතරම් වැඩි වූයේ ද යත් මුහුදු බඩ වරාය ප්‍රදේශ වල පමණක් නොව රට අභ්‍යන්තරයේ සෑම දිසාවකම මුස්ලිම් ගම්මාන බොහෝ ඇති වූ බව ක්වේරෝස් ප්‍රකාස කරයි. පළමු වන රාජසිංහ රජුගේ කාලයේ දී ඔවුන් දැරූ නිලතල බොහොමයක් ඔවුන් විසින් දිගටම දරන ලදී. ඔවුන්ගෙන් ඇතමෙක් විදානේවරුන් සහ කනක්කපුල්ලේ වරුන් වශයෙන් පත් කරනු ලැබූහ.

## දෙවන වරට නෙරපීම

බද්ධ වෛරක්කාරයන් වූ යෝනක ජනයාට ඉහළ පෙළේ පෘතුගීසීන් බොහෝ දෙනෙකු හිතවත් බව අනාවරණය වූ විට පූජක වරුන්ගෙන් වූ උද්ඝෝෂණ වඩාත් ප්‍රබල විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් යෝනක ජනයා සියලු දෙනාම පෘතුගීසි ප්‍රදේශ වලින් වහාම නෙරපන ලෙස ආඥාවක් කොන්ස්තන්තීනු ද සා නමැති පෘතුගීසි කපිතාන් ජනරාල් වෙත නිකුත් කිරීමට පෘතුගාලයේ රජු පෙලඹුණේය. මේ නෙරපීම 1626 වර්ෂයේ දී සිදු වූ අතර ඒ වර්ෂය යෝනක ජනයා කෝට්ටේ රාජධානියෙන් නෙරපන ලද වර්ෂයේ සිට වර්ෂයේ සිට සිය වසක් ගත වීමෙන් පසු එළඹුන ශත සංවත්සරය වීම ඇතැම් විට අහඹුවක් නොවිය හැකිය. කෝට්ටේ රාජධානියෙන් යෝනක ජනයා නෙරපා හරින ලද අවස්ථාවේ සීතාවක මායාදුන්නේ රජු ඔවුන්ට රැකවරණය ලබා දී පිහිට වූවාක් මෙන් ම මේ අවස්ථාවේ දී මහනුවර සෙනරත් රජු යෝනක ජනයා හරසරින් පිළි ගෙන ඔවුන්ට තම රාජධානියේ පදිංචි වීමට ඉඩ දුන්නේය. ඔවුන් ඒ රජුට අයත් ප්‍රදේශයේ වරායවල් අසල පදිංචි වූ අතර මඩකලපුවේ පමණක් හාරදහසක් පමණ පදිංචි වූ බව කියනු ලැබේ. මේ අනුව, මෙකල නැගෙනහිර වෙරළබඩ ප්‍රදේශ වල දක්නට ලැබෙන විශාල යෝනක ජනගහනය සෙනරත් රජතුමා විසින් ඇති කරන ලද යෝනක ජනපද වල පදිංචිකරුවන්ගෙන් පැවත එන්නන්ගෙන් සමන්විත යැයි සිතිය හැකිය.

1626 වර්ෂයේ දී පෘතුගීසි ප්‍රදේශ වලින් යෝනක ජනයා පිටුවහල් කිරීමෙන් පසු කලක දී ඔවුන් විශාල සංඛ්‍යාවක් රංචු පිටින් ආපසු පැමිණීම වළක්වාලීමට සමත් නොවීය. සිංහල යුද්ධ හමුදාව කැටු ව යාමෙන් හෝ අනෙකුත් විවිධ ක්‍රම වලින් යෝනක ජාතිකයින් පෘතුගීසි ප්‍රදේශ වල නැවත පදිංචියට ගිය බව පෙනේ. බලධාරීන්ගේ නොසැලකිල්ල නිසා පසු කලක යෝනක ජනයා අපේ වරාය වලට යළිත් පදිංචියට පැමිණියහ යැයි ක්වේරෝස් මේ ගැන කනගාටුව පළ කරමින් ප්‍රකාශ කරයි. තවද මාලදිවයින් වල දූපත් කිහිපයක් මුහුදුබත් වීම නිසා මාලදිවයින් වැසියන් බොහෝ දෙනෙකු කළුතරට සහ අලුත්ගමට පැමිණි හෙයින් මේ නගර දෙකෙහි මුස්ලිම් ජනගහනය මේ කාලයේදී සැලකියයුතු ප්‍රමාණයකින් වැඩි විය. ද සූසාගේ පාලන කාලයට පෙර යෝනක ජනයා ගැන ඉවසා සිටීමට සහ ඇතැම් විට ඔවුන්ට සැලකිලි දැක්වීමට පවා පෘතුගීසීන් පෙලඹුණු හේතුන් ම 1630 දී රන්දෙනිවෙලෙහි දී උඩරට හමුදාවට ද සූසා පරාජයට පත් වී ඔහුගේ මරණය සිදු වීමෙන් පසු යළිත් ඔවුන් ගැන ඉවසීමට සහ ඔවුන්ට ධෛර්ය දීමට තුඩු දුන්නේ යැයි කිව හැකිය.

## ඝාතනයක්

සමස්තයක් වශයෙන් ගත් කළ මේ කාලයේ දී යෝනක ජනයා අවිනිශ්චිත තත්ත්වයක ජීවත් වූහ. ලන්දේසීන් උඩරට වැසියන් සමග සම්මුතියක් ඇති කර ගැනීමෙන් පසු නිරිතදිග ප්‍රදේශයේ මුහුදුබඩ නගර කරා ද යුද්ධය පැතිර ගියේය. බලය අල්ලා ගැනීම සඳහා පෘතුගීසීන් සහ ලන්දේසීන් අතර සටන් සිදු වන විට ඒ අතරට අසු වූ යෝනක

ජනයාට සහ මුහුදුබඩ වාසීන්ට නොයෙක් ව්‍යසන වලට මුහුණ පෑමට සිදු විය. ඒ ඒ කාලයේදී ඒ ඒ ප්‍රදේශයේ වැඩි බලයක් දැරූ ජාතියට අපක්ෂපාතී වී යැයි සැක කරන ලද සෑම අවස්ථාවකදීම යෝනක ජනයාට ඔවුන්ගෙන් ගැහැට විඳීමට සිදු විය. මෙවැනි එක් දුර්දාන්ත අවස්ථාවක් 1646 දී එළඹිණි. අන්ටෝනියෝ ද අමරල් නමැති පෘතුගීසි කපිතාන්ගේ අණ පරිදි මේ වර්ෂයේ දී මාතර යෝනක ජනයා ඉතා අමානුෂික අයුරින් ඝාතනය කරන ලදී. මේ අවධියේ දී යුද්ධය පෘතුගීසීන්ට අවාසිදායක වූ අතර නොබෝ කලකින්ම කබලින් ලිපට වැටුණාක් මෙන් පෘතුගීසීන්ගෙන් පමණක් නොව ඔවුන්ගේ තැන ගත් ලන්දේසීන්ගෙන් ද ගැහැට විඳීමට යෝනක ජනයාට සිදු විය.

**නිමි**

IslamHouse.com